**කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතිය - 02 කොටස - 2019**

**--------------------------------------------------------------------------------------------**

කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතියේ 02 කොටස 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2017 ජනවාරි 17 දින එළඹි අංක 5873 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛණ 02 හි 11 වගන්තියේ ආ.3 සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතියේ 02 කොටස ක්‍රියාත්මක කරවීමේ හා කිරීමේ නියෝජිතායතනය වේ. යාපනය, මුලතිව්, අනුරාධපුරය, මඩකලපුව, මොණරාගල, මාතලේ සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කෘෂි ඵලදායීතාවය ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාර මගින් කෙරෙන අගය එකතු කිරීම් වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. තවද තරගකාරී සහ අලෙවිකළ හැකි භාණ්ඩ නිපදවීමට සුළු පරිමාණ ගොවීන් සඳහා සහයවීම, වෙළඳපොළ අවශ්‍යතා සඳහා ඔවුන්ගේ හැකියාව වැඩිදියුණු කිරීම සහ වාණිජකරණය දෙසට ගමන් කිරීම යන කටයුතු කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතියේ 02 කොටස යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 9,175.88 කට සමාන එජඩො මිලියන 64.87 සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලැසුම් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දුස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති,රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | -------------------- | --------------------- | --------- | -------------- | ------------ |
| (අ) | මුදල්අමාත්‍යාංශයේ 2002 නොවැම්බර් 28 දිනැති අයිඒඅයි/ 2002/02 දරණ | රු.මිලියන11.09ක පිරිවැයකට මිළදීගත් පරිගණක හා උපාංග, පරිගණක හා උපාංග | අනෙකුත් අරමුණු භාවිතය, අවභාවිතයන් | පරිගණක හා උපාංගවල ප්‍රධාන ඉන්වෙන්ට්‍රියට අමතරව | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලවීම අවශ්‍ය වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | චක්‍රලේඛය | ලේඛණයේ වාර්තාකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සඳහා ලැප්ටොප් සහ අනෙකුත් පරිගණක භාවිතා කල නොහැකි අතර ව්‍යාපෘති කාර්යාලයේ නිකුත් කල අයිතමයන් පිළිබඳ වාර්තා නොමැතිවීම හේතුවෙන් වෙනත් අරමුණු සඳහා භාවිතා කිරීමට අවස්ථාව ලැබේ. | සහ හානිවීම් සිදුවීමට ඉඩ ඇත. | වර්තමානයේ පරිගණක නිකුත් කිරීම සඳහා විස්තරාත්මක ලේඛණයක් නඩත්තු කරන අතර 'Busy' නැමති ගිණුම්කරණ මෘදුකාංගයේ සියළුම වත්කම් වාර්තා කර ඇත. | |
| (ආ) | කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2016 ජුනි 10 දිනැති අංක 02/2016 දරණ කළමණාකරණ විගණන චක්‍රලේඛය | ව්‍යාපෘතිය විසින් අභ්‍යන්තර විගණකවරයකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ගණුදෙනු කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක ඒකකයේ විගණනයට යටත් වී නොතිබුණි. | අභ්‍යන්තර පාලනය විධිමත්ව ක්‍රියාත්මක වී නොතිබුණි. | 2020 ජුලි 19 දින අභ්‍යන්තර විගණකවරයකු බඳවා ගැනීමට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණු අතර මෙම තනතුර කඩිනමින් පිරවීමට පියවර ගනු ලැබේ. | අභ්‍යන්තර විගණකවරයකු බඳවා ගැනීමට හෝ ගණුදෙනු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය සිදු කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ණය මගින් මූල්‍යකරන ආයෝජන ව්‍යාපෘති සඳහා වන ලෝක බැංකු ප්‍රසම්පාදන රෙගුලාසිවල 7.39(ආ) වගන්තිය | ලෝක බැංකු ප්‍රසම්පාදන රෙගුලාසිවලට එරෙහිව ප්‍රසම්පාදන උපදේශක 2018 අගෝස්තු මස සිට රු.250,000 මාසික වැටුපකට මාස 6ක් පුරා බඳවාගෙන තිබුණු අතර 2019 වර්ෂය අවසාන වන විට එකතුව රු.මිලියන 1.5ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | උපදේශක සඳහා අනවශ්‍ය වාසියක් ලැබේ. | ප්‍රසම්පාදන උපදේශක කෙටි කාලයක් සඳහා බඳවා ගෙන තිබුනද ජාත්‍යන්තර ප්‍රසම්පාදන පද්ධති සහ ක්‍රමවේද පිළිබඳ ඔහුගේ අත්දැකීම් හා විශේෂිතවූ දැනුම සලකා බැලීමේදී ලෝක බැංකුවේ ඒකගත්වය සමග ඔහුගේ සේවය අඛණ්ඩව ලබාගෙන තිබුණි. | ලෝක බැංකුවේ ප්‍රසම්පාදන රෙගුලාසි සමග අනුකූල වීම අවශ්‍ය වේ. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

ව්‍යාපෘතියේ කටයුතු සංරචක 5ක් යටතේ ක්‍රියාත්මක වේ.

(අ) ගොවීන්ගේ පුහුණුව හා ධාරිතාවය වර්ධනය කිරීම.

(ආ) නවීන කෘෂි තාක්ෂණික උද්‍යාන පිහිටුවීම.

(ඇ) නිෂ්පාදන සහ අලෙවිකරණ යටිතල පහසුකම් සැපයීම.

(ඇ) විශ්ලේශණ සහ ප්‍රතිපත්ති උපදේශන සහය ලබා දීම.
(ඉ) ව්‍යාපෘති කළමණාකරනය, නියාමනය සහ ඇගයීම.

| | සංරචකය | ක්‍රියාකාරකම් | විගණන ගැටළු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| | ----------- | --------------- | ----------------- | --------- | ----------------- | ------------- |
| (අ) | නවීන කෘෂි තාක්ෂණික උද්‍යාන පිහිටුවීම. | ජාත්‍යන්තර සේවා සපයන්නෙකු බඳවා ගැනීම | ජාත්‍යන්තර සේවා සපයන්නෙකු ගේ බඳවා ගැනීම් වර්ෂ 3ක් තිස්සේ ප්‍රමාද වී තිබුණි. | ව්‍යාපෘතියේ කාලය දීර්ඝකිරීමට සිදුවන අතර එය ව්‍යාපෘතියේ සමස්ථ කාලසටහන සඳහා බලපානු ලැබේ. | ලෝක බැංකු සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම් අතර 2017 ජනවාරි 17 දින ණය ගිවිසුම අත්සන් කල දින සිට ව්‍යාපෘතිය නිල වශයෙන් ආරම්භ වුවද ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යමණ්ඩලය බඳවාගැනීමෙන් පසු 2017 වර්ෂයේ අගභාගයේදි ව්‍යපෘතියේ කටයුතු ආරම්භ කර ඇත. තවදුරටත් මෙම ප්‍රසම්පාදනය සඳහා 2017 දෙසැම්බර් 01 දින ලෝක බැංකුවේ අනුමැතිය ලැබී ඇත. | ජාත්‍යන්තර සේවා සපයන්නා සමග වඩිමත් සම්බන්ධතාවයක් පවත්වා ගැනීම අවශ්‍ය අතර ප්‍රමාද වූ කටයුතු ආවරණය කර ගැනීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | විශ්ලේෂණ හා ප්‍රතිපත්ති උපදේශක සහාය | ප්‍රතිපත්ති සංවර්ධනය | මෙම සංරචකය සඳහා රු.මිලියන 624.67කට සමාන එජඩො මිලියන 4.28 ක් වෙන් කිරීමක් සිදු කර ඇත. කෙසේවෙතත් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 44.72 කට සමාන එජඩො මිලියන 0.3 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | ඇල්ම ඇති පාර්ශවයන් වෙත අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | ප්‍රමානවත් පරිදි පිළිතුරු සපයා නොමැත. කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා "ජාතික කෘෂිකාර්මික තොරතුරු පද්ධතියක්" සංකල්පනය කිරීම සඳහා තාක්ෂණික සහාය, ප්‍රතිපත්ති සම්පාදනයට සහය දැක්වීම සඳහා දත්ත රැස් කිරීම සහ කළමනාකරණය සඳහා ධාරිතාවය ගොඩනැගීම, රාජ්‍ය සේවා සැපයීම වැඩිදියුණු කිරීම සහ කෘෂිකර්මාන්තයේ අවදානම් අධීක්ෂණයවැඩි දියුණු කිරීම. | අදාල පාර්ශවයන් වෙත බලපෑම් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු අතර ව්‍යාපාතිය විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳ නිසි අධීක්ෂණයක් සිදුකිරීම අවශ්‍යවේ. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඇ) | නිෂ්පාදන සහ අලෙවිකරණ යටිතල පහසුකම් | නිෂ්පාදන සහ අලෙවිකරණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම. | ජාත්‍යන්තර සේවා සපයන්නෙකු බඳවා ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් නවීන කෘෂිකාර්මික උද්‍යාන ස්ථාපනය වැනි වැදගත් කාර්යයන් නිම කිරීමකින් තොරව නියමු ව්‍යාපෘති ප්‍රදේශයේ ග්‍රාමීය මාර්ග , ග්‍රාමීය ටැංකි, ළිං සහ ගබඩා පහසුකම් පුනරුත්තාපන සඳහා ව්‍යාපෘතිය එකතුව එ.ජ.ඩො මිලියන 4.93ක් වැය කර තිබුණි. | අපේක්සිත අරමුණු අත්කර ගතනොහැකි වේ. | ප්‍රමානවත් පරිදි පිළිතුරු සපයා නොමැත | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමේ අරමුනින් ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ සඳහන් අරමුණු සමග කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටළු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | -------------- | ----------- | ----------------- | -------------- |
| (අ) | ප්‍රතිපත්ති සංවර්ධන කොන්ත්‍රාත්තු 8ක් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 69.55කට උපදේශන සමාගම් 8 ක් වෙත පිරිනමා තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී උපදේශන සමාගම් වෙත එකතුව රු.මිලියන 36.4 ක් ගෙවා තිබුනද ඒ සම්බන්ධ අවසන් වාර්තා නියමිත දින තුළදී ඉදිරිපත් කර නොතිබුණි. | ඇල්ම ඇති පාර්ශවයන්ට වෙත අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | ප්‍රමාණවත් පරිදි පිළිතුරු සපයා නොමැත | කොන්ත්‍රාත් ගිවිසුම්වල අවශ්‍යතා සමග අනුකුල වීමට උපදේශණ සමාගම් යොමු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2018 ඔක්තෝබර් 28 දින රු.මිලියන 8.25ක ඇස්තමේන්තු ගත පිරිවැයකට ප්‍රතිලාභීන්ගේ තොරතුරු පද්ධතියක් සැලසුම් කිරීම, සංවර්ධනය, ස්ථාපනය සහ නඩත්තු කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර 2019 පෙබරවාරි 27 දින වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකතුව රු.මිලියන 1.65ක් ගෙවා තිබුණද විගණන දිනය වන 2020 ජනවාරි 30 දින වන විට මාස 16ක් අවසන් වී තිබුණද අදාල කටයුතු නිම කර නොතිබුණි. | ඇල්ම ඇති පාර්ශවයන්ට වෙත අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | සැලකිය යුතුකාලයක් අවශ්‍යවන ලෝක බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ අදියර කිහිපයක් අනුගමනය කිරීම හරහා ව්‍යාපෘතියේ ප්‍රසම්පාදනයන් සිදු කල යුතුවේ. තවදුරටත් 2019 දී සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාරය හා ලෝක ව්‍යාප්ත කොවිඩ් 19 රෝගය ප්‍රමාදයන් සඳහා බලපා ඇත. | කොන්ත්‍රාත් ගිවිසුම්වල අවශ්‍යතා සමග අනුකූල වීමට කොන්ත්‍රාත්කරු යොමු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුලදී ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 107.46 ක පිරිවැයකට කෘෂි ව්‍යාපාර පාසල් පුහුණු කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී සේවා සැපයුම්කරුවෙත එකතුව රු. මිලියන 11.85 ක් ගෙවා තිබුණි. ලැබී තිබුණු තොරතුරු අනුව සේවා සැපයුම්කරුගේ දුර්වල සැලසුම්කරණය සහ ගොවීන් තෝරාගැනීමේ අඩුපාඩු හේතුවෙන් පුහුණු වැඩසටහන් අපේක්ෂිත මට්ටමින් සම්පූර්ණ කර නොතිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ගොවීන් වෙත නොලැබේ. | මුල් නියමු වැඩසටහන් 20 දී ගොවීන් 1,750 කින් 1,450 ක් ගොවීන් කෘෂි ව්‍යාපාර පාසල් පුහුණුව සම්පූර්ණ කර ඇත. එම ගොවීන් කණ්ඩායම සඳහා දෙන ලද කෘෂි නිෂ්පාදන සංවිධාන පුහුණුව වර්තමානයේ අවසන් කර ඇත. ඒ අනුව පුහුණු මිනිස් දින 30,000 ආවරණය කර ගැනීමට හැකිවේ. ව්‍යාපෘතිය සියයට 80 වඩා වැඩි සාර්ථකත්වයෙන් යුතුව ගොවි පුහුණු වැඩසටහන් අවසන් කර තිබේ. | කොන්ත්‍රාත් ගිවිසුමේ අවශ්‍යතාවයන් සමග අනුකූලවීමට සේවා සැපයුම්කරු පෙළඹවීමට අවශ්‍ය පියවර ගත යුතුවන අතර ගොවීන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව නිසි අධීක්ෂණයක් අවශ්‍ය වේ. |

## 3.3 වැඩ බිම් පරීක්ෂාවේදී සිදුකරන ලද නිරීක්ෂණ

| | විගණන ගැටළු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | --------------- | ---------- | -------------------- | -------------- |
| (අ) | තිර ආවරණ, වැසුම්, බිංදු | ඵලරහිත වියදමකි. | ව්‍යාපෘතියේ උපදෙස් | අමතර පිරිවැය වලක්වා |

| | | | | |
|---|---|---|---|---|
| | වාරි පද්ධතිය එක් වගා කන්නයකදී පමණක් භාවිතා කරන අතර අඛණ්ඩව භාවිතා කිරීමකින් තොරව ඉවත් කරන බව අනුරාධපුර දිස්ත්‍රිකයේ කෘෂිකාර්මික ඉඩම්වල කරන ලද වැඩබිම් පරීක්ෂාවේදී අනාවරණය විය. එම නිසා ඒ සඳහා දරන ලද රු. මිලියන 488 ක මුදල ඵලරහිත වේ. | | පිළිපැදීමට අකමැති සමහර ප්‍රතිලාභීන්ගෙන් අදාල FPO සහ ව්‍යාපෘති නිලධාරින්ගෙන් කැමැත්ත ඇතිව යෙදවුම් ලබාගෙන ඇති අතර වෙනත් ප්‍රතිලාභීන් වෙත බෙදා හැර ඇත. පොලිතින් වැසුම් එක් වරක් පමණක් භාවිතා කළ හැකි අතර දිරාපත් වීමේ ස්වභාවය හේතුවෙන් නැවත භාවිතා කළ නොහැක. කන අදාළ එෆ්පීඕ සහ කෙසේ වෙතත්, ප්‍රතිලාභීන් ඉතා සුළු පිරිසක් ඒවා නැවත භාවිතා කර ඇත. දැන් තත්වය යථා තත්ත්වයට පත්ව ඇති අතර ගොවීන් සියලු කටයුතු වලට සම්බන්ධ වෙමින් සිටී. | ගැනීමට උපකාර්යාල ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳ ව්‍යාපෘති කළමණාකරන ඒකකය නිසි නියාමන සහ අධීක්ෂණ යාන්ත්‍රණයක් අනුගමනය කළයුතුය. |
| (ආ) | පුහුණු වැඩසටහන් නිසි සැලසුමකින් තොරව පැවැත්වීම හේතුවෙන් රු. මිලියන 16 ක් වටිනා පුහුණු අත්පොත් 8,606 ක තොගයක් කෘෂි ව්‍යාපාර සංවිධාන වෙත බෙදාහැරීමකින් තොරව වර්ෂයක් පුරා පැවති බව 2020 ජුනි මස ව්‍යාපෘති කළමණාකරන ඒකකයේ ගබඩාවල සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී අනාවරණය විය. | ඵලරහිත වියදමකි. | මුද්‍රණය කළ යුතු පුහුණු අත්පොත් සහ වැඩපොත් ප්‍රමාණය අපේක්ෂිත ගොවීන්, දිස්ත්‍රික්ක සහ ඔවුන්ගේ භාෂාව මත පදනම් විය. කැලි පදනම මත මෙම ලියවිලි මුද්‍රණ පිරිවැය පමණක් සම්බන්ධ නොවන අතර එය කාලය ගතවන ක්‍රියාවලියකි. මෙම තත්ත්වය සලකා අනාගත අවශ්‍යතා මත සැලකිය යුතු විශාල තොගයක් මුද්‍රණයට තීරණය කරන ලදී. නුදුරු අනාගතයේදී සම්පූර්ණයෙන්ම යොදා ගැනීමට අපේක්ෂිත නිකුත් නොකරන ලද පොත් සුරක්ෂිතව ගබඩාවල පවතී. | මුද්‍රණ කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර පුහුණු අත්පොත්වල අවශ්‍යතාවය නිසි පරිදි තක්සේරු කළ යුතුය. |

**3.5 ඌන උපයෝජිත සම්පත්**

| විගණන ගැටළු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| ලැබී තිබුණු තොරතුරු අනුව ව්‍යාපෘතියේ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය සාමාන්‍ය මට්ටමක පැවතුණි. තවද ණය මුදල් මගින් කරන ලද රු.මිලියන 9,121.88 කට සමාන එජඩො මිලියන 62.5 ක වෙන්කිරීමෙන් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර වර්ෂ 03 ක් ගත වීමෙන් පසු 2019 දෙසැම්බර් 31 දිනට සියයට 36.5 ක් නියෝජනය වන රු.මිලියන 2,264.32 කට සමාන එජඩො මිලියන 65.54 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘතියේ දුර්වල කාර්යසාධනයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රදාන වශයෙන් ලැබීමට නියමිතව තිබුණු එකතුව යුරෝ මිලියන 25 ක් ප්‍රදාන නියෝජිත ආයතනය විසින් ප්‍රදානය කර නොතිබුණි. | ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසානයේ දී මුළු අරමුදල් ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමට නොහැකිවේ. | කෘෂි කාර්මික තාක්ෂණික උද්‍යාන ස්ථාපනය, කළමණාකරනය සහ පැවරීම සඳහා ජාත්‍යන්තර සේවා සපයන්නකු තෝරා ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘතියේ කාර්යසාධනයට මූලිකවම බලපා ඇත. ජාත්‍යන්තර සේවා සපයන්නකු පත්කර ඇති අතර කටයුතු ආරම්භ කර ඇත. මෙම තත්ත්වය ඉක්මනින් නිවැරදි කරනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුළදී ලැබුණු රු. මිලියන 1,640 ක මුළු අයවැය ප්‍රතිපාදනයම උපයෝජනයට සැලසුම් කර තිබුණද 2019 දෙසැම්බර් 31 දිනට පෙර ජාත්‍යන්තර සේවා සපයන්නා විසින් දේශීය බැංකු ගිණුම විවෘත කිරීමට නොහැකි වීම නිසා කොන්ත්‍රාත්තුවේ දේශීය කොටසේ සියයට 20 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම ගෙවීමට නොහැකි වීම නිසා උපයෝජනය සියයට 96.77 කට සීමාවිය. | ව්‍යාපෘතියේ සඳහන් කර ඇති ඉලක්ක සපුරාගැනීමට පියවර ගත යුතුය. |